දෙපාර්තමේන්තු චක්‍රලේඛ : **01/2021**

මගේ අංකය - DAPH/AD/16/06/2021
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය,

2021.01.13

ලේකම් (පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය/ සෞඛ්‍ය අමාත්‍යාංශය)
අධ්‍යක්ෂ ජනරාල්(වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව).
අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය /සත්ව අභිජනන/ පශු පර්යේෂණ/ පශු සම්පත් සැලසුම් හා ආර්ථික/පශු අණපනත් හා නීති / මානව සම්පත් සංවර්ධන)
පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම/ඌව/දකුණ/නැගෙනහිර/බස්නාහිර/සබරගමුව/උතුරුමැද/වයඹ/උතුර)
නාගරික කොමසාරිස් (කොළඹ/ මහනුවර/ ගම්පහ/ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ/ දෙහිවල ගල්කිස්ස/ මොරටුව/ කඩුවෙල/ මීගමුව/ අනුරාධපුරය / යාපනය)

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 2013.12.13 දිනැති නව සේවා ව්‍යවස්ථාවේ 12 : 6 II හා 12: 6 III පරිච්ඡේදයන්ට අනුව නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා.**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2016.12.01 දිනැති 05/2016 හා 2019.07.25 දිනැති 05/2016(1) දෙපාර්තමේන්තු චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමු කරවමි. ඒ අනුව උක්ත චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ විවිධ ශ්‍රේණිවල නිලධාරීන්ගේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක වේ. මෙම සියලුම පුහුණු පාඨමාලා අඛණ්ඩ අධ්‍යාපන ආයතනය විසින් සංවිධානය කරනු ලැබේ.

**2.1 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් එම සේවයේ II ශ්‍රේණියට සුදුසුකම් ලැබීමට පහත දැක්වෙන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන ආකාරයට අවම වශයෙන් දින 03ක පුහුණු පාඨමාලාවන් පැවැත්වේ.

- සේවාස්ථ පුහුණුව III ශ්‍රේණිය (III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පමණි)

මෙම පුහුණු පාඨමාලාව පහත විෂය ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. ඒ අනුව මෙම ඒකක අතුරින් 1 හා 2 යන ඒකක අනිවාර්ය වන අතර, 3-11 දක්වා ඇති ඒකක වලින් අවම වශයෙන් තෝරාගත් ඒකක තුනක් සම්පූර්ණ කල යුතුයි.

1. සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය රෙගුලාසි (General Administration & Financial regulations)
2. පොදු කළමනාකරණය ( General Management)
3. ව්‍යාප්ති හා සන්නිවේදනය (Extension & Communication)
4. සත්ත්ව සෞඛ්‍ය (Animal Health)
5. සත්ත්ව අභිජනන (Animal Breeding)
6. සත්ත්ව පෝෂණ හා කළමනාකරණය ( Animal Nutrition & Management)
7. පශු මහජන සෞඛ්‍ය ( Veterinary Public Health)
8. ව්‍යාපෘති සැලසුම් කිරීම ( Project Planning)
9. පශු අණපනත් කටයුතු ( Veterinary Regulatory Affairs )
10. පශු ආර්ථික හා සංඛ්‍යා ලේඛනය ( Veterinary Economic & Statistic )
11. කිරි ගොවිපල කළමනාකරණයේ නූතන තාක්ෂණ ක්‍රම ( New Technology for Dairy Farm Management )

**2.2 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා.**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් ලැබීමට පහත දැක්වෙන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන ආකාරයට අවම වශයෙන් දින 02 බැගින් වූ පුහුණු පාඨමාලා 03 ක් මගින් සම්පූර්ණ කලයුතුය.

- **සේවාස්ථ පුහුණු II ශ්‍රේණිය (දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පමණි)**

- මෙම පුහුණු පාඨමාලාව පහත විෂය ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. ඒ අනුව මෙම ඒකක අතුරින් පළමු ඒකකය අනිවාර්ය වන අතර 2-9 දක්වා ඇති ඒකක වලින් අවම වශයෙන් තෝරා ගත් ඒකක 02ක් සම්පූර්ණ කල යුතුයි.

1. නායකත්වය, ගැටළු විසඳීම හා තීරණ ගැනීම - Leadership, Problem solving and decision making.
2. රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය - General behavior and discipline of Government Service.
3. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ලංසු ඇගයීම - Government Procurement Procedure & Bid Evaluation.
4. ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම - Project Monitoring & Evaluation.
5. වෙළඳාම පහසුකරණය සඳහා පශු වෛද්‍ය අවශ්‍යතාවයන් - Veterinary Requirement for Trade Facilitation.
6. ප්‍රතිජීවක ඖෂධ ප්‍රතිරෝධය හා ආහාර සුරක්ෂිතභාවය - Anti Microbial Resistance and Food Safety.
7. සත්ත්ව සුභසාධන උදෙසා පශු වෛද්‍යවරුන්ගේ කාර්යයභාරය - Role of Veterinary Practice in Animal Welfare.
8. සත්ත්ව පාලනය හා පාරිසරික බලපෑම් අවම කර ගැනීම - Livestock Management and Environment Issues.
9. පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය උදෙසා පිරිවැය හා ප්‍රතිලාභ විශ්ලේෂණය -Cost benefit analysis for sustainable livestock Products development.

**2.3 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා.**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පහත දැක්වෙන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය. මේ සඳහා පහත දැක්වෙන ආකාරයට අවම වශයෙන් දින 05 ක පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කළ යුතුය.

- **සේවාස්ථ පුහුණුව - I ශ්‍රේණිය ( I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පමණි)**
  කළමනාකරණ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන (අවම දින සංඛ්‍යාව 05 කි.)

- මෙම පුහුණු පාඨමාලාව පහත විෂය ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ.

1. කළමනාකරණ මූලධර්ම ( Management Principals )
2. කළමනාකරණ කෘත්‍යයන් ( Management Functions )
3. කළමනාකරණ පරිසරය ( Management Environment )
4. සහභාගිත්ව කළමනාකරණය ( Participation Management )
5. මහජන සබඳතා ( Public Relations )
6. සන්නිවේදන කුසලතා ( Communication Skills )
7. යහපාලනය ( Good Governance )
8. ආචාරධර්ම (Ethics )

බාහිර හා අභ්‍යන්තර සම්පත් දායකයින් යොදා ගන්නා අතර, අවශ්‍ය නිලධාරීන්ට අඛණ්ඩ අධ්‍යාපන ආයතනය මගින් නේවාසික පහසුකම් සලසනු ලැබේ. මෙම පාඨමාලා සාර්ථකව හදාරා සම්පූර්ණ කරන නිලධාරීන් හට අවසානයේදී අඛණ්ඩ අධ්‍යාපන ආයතනය මගින් සහතිකයක් නිකුත් කරනු ලැබේ.

වෛද්‍ය. ආර්.හෙට්ටිආරච්චි
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. විගණකාධිපති